## ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය 2012

### 1. මූල්‍ය ප්‍රකාශන

#### 1.1 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 1.2 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2012 දෙසැම්බර් 31 දිනට ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

#### 1.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම්

##### 1.2.1 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සංවිධානයේ නායයෑම් පර්යේෂණ හා අවදානම් කළමනාකරණ අංශය රු.112,760 ක වටිනාකමක සහිත ව්‍යාපෘති 03 ක් සමාලෝචිත වර්ෂය තුළදී අවසන්කර තිබුණත් එය කෙරගෙන යන වැඩ යටතේ දක්වා තිබුණි.

(ආ) නායයෑම් පර්යේෂණ හා අවදානම් කළමනාකරණ අංශය මගින් සිදුකරන ලද විශේෂ නායයෑම් පරීක්ෂණ වෙනුවෙන් ප්‍රාදේශීය සභා වෙතින් රු.13,158,334 ක් ලැබිය යුතු වුවත් සමාලෝචිත වර්ෂය තුළදී ඉන් රු.10,920,000 ක් පමණක් ලැබී තිබුණි. හිඟ මුදල් අයකර ගැනීමට සංවිධානය විසින් ක්‍රමවේදයක් සකස් කර නොතිබුණි.

##### 1.2.2 නොසැසඳූ පාලන ගිණුම්

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණු ආදායම හා ඉදිරිපත් කරන ලද භූ තාක්ෂණ ඉංජිනේරු අංශයේ, මානව ජනාවාස හා පාරිසරික අංශයේ ආදායම් ලේඛණය අනුව එම ශේෂ සමඟ සැසඳීමේදී පිළිවෙලින් රු.2,009,692 ක් අඩුවෙන්ද, රු.205,302 ක් වැඩියෙන්ද දක්වා තිබුණි.

### 1.2.3 ලැබිය යුතු ගිණුම්

සමාලෝචිත වර්ෂය අවසානයට සමුච්චිත ණයගැති ශේෂය රු.30,049,397 ක් වූ අතර ඉන් රු.17,676,718 ක් 2010 වර්ෂයේ සිට පැවත එන ශේෂ විය.

ඒ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) එකතු වටිනාකම රු.16,543,144 ක්වූ ණයගැතියන් 36 දෙනෙකු වෙත ශේෂ සනාථ කිරීමට අදාල ලිපි එවා තිබුණත් ඉන් එකතුව රු.15,846,254 ක් වටිනා ණයගැතියන් 32 ක් ශේෂයන් සනාථ කර නොතිබුණි.

(ආ) 1991 වර්ෂයේ සිට 2009 වර්ෂය දක්වා කාලපරිච්ඡේදයක සිට පැවතඑන එකතුව රු.12,372,679 ක් වූ ණයගැති ශේෂය තුළ රාජ්‍ය අංශයේ ආයතන 37 කින් අයවිය යුතු එකතුව රු.10,399,350 ක් සහ පෞද්ගලික අංශයේ ආයතන 90 කින් අයවිය යුතු එකතුව රු.1,973,328 ක් ශේෂ 2013 දෙසැම්බර් 31 දින වන විටත් අයකර ගැනීමට නොහැකි වී තිබුණි.

(ඇ) සංවිධානය විසින් ඉකුත් වර්ෂය තුළදී මිලදී ගැනීම් සහ පර්යේෂණ කටයුතු සඳහා භාණ්ඩාගාරයෙන් ලැබුණු මුදලට වඩා රු.10,500,000 ක් වියදම් කර තිබුණි. එසේ වැඩිපුර වැයකළ මුදල 2011 වර්ෂයේදී හා සමාලෝචිත වර්ෂයෙ මූල්‍ය ප්‍රකාශනවල ලැබිය යුතු භාණ්ඩාගාර ප්‍රදානයක් ලෙස දක්වා තිබුණි.

### 1.2.4 විගණනය සඳහා සාක්ෂි නොවීම

පහත සඳහන් ගණුම් විෂයයන ඉදිරියෙන් දක්වා ඇති සාක්ෂි විගණනයට ඉදිරිපත් නොවීය.

| | විෂයයන් | වටිනාකම | ඉදිරිපත් නොකළ සාක්ෂි |
|---|---|---|---|
| | | රු. | |
| (අ) | වැටුප් හා වේතන | 86,186,185 | වැටුප් හා වේතන ලේඛනය |
| (ආ) | යෝග්‍යතා සහතික නිකුත් කිරීමේ ආදායම | 15,009,258 | දිස්ත්‍රික් කාර්යාල ආදායම් ප්‍රකාශන |
| (ඇ) | ස්ථාවර තැන්පතු පොලී | 498,411 | ස්ථාවර තැන්පතු ගොනුව, ස්ථාවර තැන්පතු ලේඛනය සහ ස්ථාවර තැන්පතු පිළිබඳ ගිණුම් සටහන් |

### 1.2.5 නීති ,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

පහත සඳහන් අනුකූල නොවීම් විගණනයේදී නිරීක්ෂණය විය.

| නීති ,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ) ආයතන සංග්‍රහයේ XII පරිච්ඡේදයේ 22.4 වගන්තිය | සංවිධානයේ නිලධාරීන් විසින් ලබාගත් වැටුප් රහිත නිවාඩු පිළිබඳ විස්තර විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි. |
| (ආ) මුදල් රෙගුලාසි | |
| මු.රෙ.1646 | සංවිධානය සතු සංචිත වාහන 16 ක් සම්බන්ධව සමාලෝචිත වර්ෂයේ ඔක්තෝබර් සිට දෙසැම්බර් දක්වා මාසවලට අදාල දෛනික ධාවන සටහන් හා මාසික සංසිද්ධි වාර්තා විගණනය වෙත ඉදිරිපත් කර නොතිබුණි. |
| (ඇ) 1990 ඔක්තෝබර් 10 දිනැති අංක 41/90 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය | සංවිධානය සතු වාහන 16 ක් සම්බන්ධයෙන් ඉන්ධන දහනය පරීක්ෂා කර නොතිබුණි. |
| (ඇ) ආයතනයේ චක්‍රලේඛ | |
| 2011 අප්‍රේල් 07 දිනැති අංක එන්බීආර්ඕ / අයිඒ /සීඅයිඒ / 2011 /03 දරන ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය අභ්‍යන්තර චක්‍රලේඛය | චක්‍රලේඛ විධිවිධානයන්ට පටහැනිව සංවිධානය විසින් ධාවනයේ යොදවා ගත් කුලී වාහන 05 ක් වෙනුවෙන්, අවස්ථා 23 කදී එකතුව රු.772,199 ක් සැපයුම්කරුවන්ට ගෙවීම් කර තිබුණි. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂය සඳහා සංවිධානයේ මෙහෙයුම් කටයුතුවලින් රු.21,461,664 ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයෙ අතිරික්තය රු.15,406,703 ක් වූයෙන් මූල්‍ය ප්‍රතිඵලයේ රු.6,054,961 ක වර්ධනයක් පෙන්නුම් කෙරිණි. සමාලෝචිත වර්ෂයේ නායයැම් අවම කිරීම සඳහා රජයෙන් ලබාදුන් දායකත්වය මූල්‍ය ප්‍රතිඵලයේ වර්ධනයට ප්‍රධාන වශයෙන් හේතුවී තිබුණ.

## 2.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලොචනය

---------------------------------

සමාලෝචිත වර්ෂයේ සංවිධානයේ ආදායම රු.මිලියන 208 ක් වු අතර එම ආදායම තුළ රජයේ දායකත්වය වු රු.මිලියන 62 ක් ද ඇතුළත්ව තිබුණි. ඉහත ආදායම ඉකුත් වර්ෂයේ ආදායම ව රු.මිලියන 181 සමඟ සැසඳීමේදී සියයට 15 ක වර්ධනයක් පෙන්නුම් කෙරිණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

----------------------------

### 3.1 කාර්යසාධනය

-----------------

ආපදා අවදානම අවමකරණය සහ සුරක්ෂිත නිර්මිත පරිසරයක් උදෙසා පර්යේෂණ හා සංවර්ධන කටයුතු ප්‍රවර්ධනය හා තාක්ෂණික දායකත්වය සැපයීම සංවිධානයේ ප්‍රධාන මෙහෙවර වන අතර, නායයෑම් උපද්‍රව කලාප සිතියම් ගත කිරීම සහ නායයෑම් අවම කිරීමේ ව්‍යාපෘති පවත්වා ගෙනයාම මූලික කාර්යයන් තිබුණි. මෙම මෙහෙවර හා කාර්යයන් ඉටු කිරීමේද සමාලෝචිත වර්ෂය අවසානයට සංවිධානය විසින් ලඟාකරගෙන තිබූ කාර්යසාධනය සමස්ත තොරතුරු පහත දැක්වේ.

**(අ) නායයෑම් හා කඳු කඩා වැටීමේ ඉහළ අවදානම් බෑවුම් ප්‍රදේශ ස්ථායිකරණය සඳහා වු ව්‍යාපෘතිය**

--------------------------------------------------------------------------------------------

නුවරඑළිය, මහනුවර, බදුල්ල සහ මාතලේ දිස්ත්‍රික්කයන්හි නායයෑම් හා කඳු කඩා වැටීමේ ඉහළ අවදානම් බෑවුම් ප්‍රදේශ ස්ථායිකරණය සඳහා වු ව්‍යාපෘතිය යටතේ උප ව්‍යාපෘති 05 ක් සඳහා 2009 වර්ෂයේ සිට 2011 වර්ෂය දක්වා රු.මිලියන 150 ක අරමුදල් මහා භාණ්ඩාගාරය විසින් අනුමත කර තිබුණි. අයහපත් කාලගුණික තත්ත්වය හා මූල්‍ය ප්‍රතිපාදන නිසි පරිදි නොලැබීම නිසා 2011 වර්ෂය වන විට අවසන් කළ නොහැකිවූ කාර්යයන් වෙනුවෙන් 2012 වර්ෂයේදී රු. මිලියන 160.05 ක් ප්‍රතිපාදන සළසා තිබුණි.

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) නුවරඑළිය, වලපනේ සහ හඟුරන්කෙත උප ව්‍යාපෘති ක්‍රියාත්මක නොකර අත්හැර තිබුණි.

(ii) උප ව්‍යාපෘති 04 ක් යටතේ ආපදා අවදානම් අවම කිරීම් කටයුතු සිදුකිරීමට රු.මිලියන 150.93 ක් ඇස්තමේන්තු කර 2009 වර්ෂයේ සිට 2012 වර්ෂය දක්වා රු.මිලියන 157.98 ක ව්‍යාපෘති හතරකට අදාලව වෙන් වෙන් වශයෙන් කාර්ය සාධන වාර්තාවේ ඉදිරිපත් කර තිබුණි. කෙසේ වුවද 2009

වර්ෂයේ සිට 2012 වර්ෂය දක්වා එම ව්‍යාපෘති සඳහා රු.මිලියන 137.32 ක් ලැබී තිබුණු අතර, මූල්‍ය ප්‍රකාශන අනුව වියදම රු.මිලියන 139.67 ක් ලෙස සඳහන් කර තිබුණි. ඒ අනුව කාර්ය සාධන වාර්තාවේ දැක්වෙන මුළු වියදම මූල්‍ය ප්‍රකාශනයට ඇතුළත් නොවීම නිසා රු.මිලියන 18.31 ක අඩුවීමක් නිරීක්ෂණය විය.

(iii) ව්‍යාපෘතියේ පළමු උප ව්‍යාපෘතිය නතර කර එහි වටිනාකම උප ව්‍යාපෘති අංක 02 සහ 03 ට ඇතුළත් කර අනුමත ඇස්තමේන්තු වටිනාකම වූ රු.මිලියන 150.93 ඇතුළත සියළු වියදම් දැරිය යුතු බැව් ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් විසින් දක්වා ඇතත් සංශෝධිත ඇස්තමේන්තුවේ වටිනාකම රු.මිලියන 160.5 ක් වී තිබුණි.

**(ආ) ඉදිකිරීම් යෝග්‍යතා සහතික නිකුත් කිරීම**

සංවිධානය විසින් 2011 වර්ෂයේ සිට දිස්ත්‍රික්ක 10 ක නායයෑම් අවදානම් ප්‍රදේශ හඳුනාගෙන ඉදිකිරීම් ක්‍රියාකාරකම් සඳහා යෝග්‍යතා සහතික 11,288 ක් නිකුත් කර තබුණ අතර ඒ සඳහා වූ ආදායම හා වියදම පහත පරිදි වේ.

| **වර්ෂය** | **ආදායම** | **වියදම** | **අලාභය ආදායමේ ප්‍රතිශතයක් ලෙස** |
|---|---|---|---|
| | රු. | රු. | % |
| 2011 | 10,661,974 | 21,783,022 | 104 |
| 2012 | 15,009,258 | 30,637,970 | 104 |

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) එක් එක් දිස්ත්‍රික් කාර්යාලවලින් ලැබූ ආදායම සහ දරන ලද වියදම වෙන් වෙන්ව හඳුනා ගැනීමට ගිණුම් සකස් නොකිරීම නිසා අඩු ආදායම් ලැබූ සහ වැඩි වියදම් දරන ලද දිස්ත්‍රික්ක ඒ තුළින් හඳුනා ගැනීමට නොහැකි වී තිබුණි.

(ii) සමාලෝචිත වර්ෂය තුළදී සංවිධානය විසින් දිස්තික්ක 10 ක ඉදිකිරීමට අවසර නොදී තිබුණු ගොඩනැගිලි සංඛ්‍යාව 89 ක් වුවද එම ප්‍රතික්ෂේප කරන ලද ස්ථාන වල නැවත ගොඩනැගිලි ඉදිකිරීමක් සිදුකර ඇද්ද යන්න පසුවිපරම් කිරීමේ ක්‍රම වේදයක් සංවිධානය විසින් සකස් කර නොතිබුණි.

**(ඇ) ගැරඬිඇල්ල නායයෑම් ආපදා අවම කිරීමේ ව්‍යාපෘතිය**

නුවරඑළිය දිස්ත්‍රික්කයේ කොත්මලේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ගැරඬිඇල්ල ආශ්‍රිත නායයෑම් අවම කිරීමේ ව්‍යාපෘතිය රු.මිලියන 93.01 ක ඇස්තමේන්තු වටිනාකමක් මත

2012 සිට 2015 කාලපරිච්ඡේදය තුළ ක්‍රියාත්මක කිරීම සඳහා ආරම්භ කර තිබුණි. 2012 වර්ෂයට අරමුදල් සැපයීම ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය මගින් සිදුකර තිබුණි.
සමාලෝචිත වර්ෂය සඳහා මෙම ව්‍යාපෘතියේ ඇස්තමේන්තු වටිනාකම රු.මිලියන 27.56 ක් වූ අතර, අරමුදල් ලැබීම ප්‍රමාදවීම හේතුවෙන් 2012 දෙසැම්බර් 31 දිනට ඉටුකර තිබූ කාර්යසාධනය රු.මිලියන 14.82 ක වී තිබුණි. ඒ අනුව වර්ෂය තුළ ඉටු කළ යුතු කාර්යයෙන් සියයට 43.73 ක් සම්පූර්ණ කර නොතිබුණි.

**(ඇ) නායයෑම් උපද්‍රව කලාප සිතියම් ගත කිරීම**

නායයෑම් ආපදා කලාප සිතියම්ගතකරණ ව්‍යාපෘතිය 1990 සිට 2013 නොවැම්බර් 30 දින දක්වා ක්‍රියාත්මක කරනු ලබන ව්‍යාපෘතියක් වූ අතර නායයෑම් ව්‍යාප්ත වී ඇති ආකාර හඳුනා ගැනීමට 1:10,000 පරිමාණයේ සහ 1:50,000 පරිමාණයේ සිතියම් ගත කිරීම් සිදුකරනු ලැබේ. ඒ අනුව 1990 සිට සමාලෝචිත වර්ෂය දක්වා රු.මිලියන 349 ක් ලැබී තිබුණු අතර එයින් රු.මිලියන 347 ක් වැයකර තිබුණි.

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) 1990 වර්ෂයේ සිට 2012 වර්ෂය දක්වා දිස්ත්‍රික්ක 10 ක වර්ග කි.මී.5,883 ක 1:10,000 පරිමාණයේ සිතියම් පිළියෙල කළ යුතු වුවද, දිස්ත්‍රික්ක 03 ක සිතියම්ගතකරණය අවසන් කිරීමට නොහැකිවී තබුණි.

(ii) 2006 වර්ෂයේ සිට 2008 වර්ෂය දක්වා කාලපරිච්ඡේදය තුළ කළුතර දිස්ත්‍රික්කයේ වර්ග කි.මී. 640 ක් සඳහා 1:10,000 සිතියම් සකස් කිරීමට නියමිතවී තිබුණද එම කටයුතු සමාලෝචිත වර්ෂය තළදී සම්පූර්ණයෙන් නිම කිරීමට නොහැකිවී තිබුණි.

**3.2 කාර්ය මණ්ඩල පරිපාලනය**

සංවිධානයේ තනතුරු සඳහා බඳවා ගැනීමේ පටිපාටි කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව මගින් 2012 මාර්තු 02 දින අනුමත කර තිබුණත් 2012 දෙසැම්බර් 31 දිනට පුරප්පාඩු සේවක සංඛ්‍යාව 62 ක් වී තිබුණි. එසේම නිත්‍ය තනතුරු සඳහා කොන්ත්‍රාත් පදනම මත බඳවා ගෙන තිබුණු සේවක සංඛ්‍යාව 29 ක් විය.

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2011 පෙබරවාරි මාසයේ සිට අධ්‍යක්ෂ ජනරාල් තනතුරෙහි වැඩ බැලීම සඳහා සංවිධානයේ අධ්‍යක්ෂවරයකු පත් කර තිබුණු අතර 2013 ජූනි 30 තෙක්ම මෙම තනතුරට ස්ථිර නිලධාරියකු පත් කර නොතිබුණි.

(ආ) වර්ෂ 5 ක පමණ කාල පරිච්ඡේදයක සිට සංවිධානයේ පුරප්පාඩු වී තිබුණු අධ්‍යක්ෂ තනතුරු 07 න් 2013 ජූනි 30 දිනට තනතුරු 04 ක් සඳහා නිලධාරීන් බඳවා ගෙන තබුණු අතර පුරප්පාඩුව තිබූ තනතරු 03 ක් සඳහා වැඩ බැලීමට අංශ ප්‍රධානීන් පත් කර තිබුණි.

(ඇ) සංවිධානයේ අනුමත කළමනාකරණ සහකාර (තාක්ෂණික නොවන) තනතුරු සංඛ්‍යාව 46 ක් ද, අර්ධ පුහුණු කම්කරු සංඛ්‍යාව 48 ක් ද වූ අතර, තථ්‍ය කාර්ය මණ්ඩලය පිළිවෙලින් 35 ක් සහ 41 ක් ද, කොන්ත්‍රාත් බඳවා ගැනීමේ පිළිවෙලින් 15 ක් සහ 20 ක් ද විය. මේ අනුව අනුමත කාර්ය මණ්ඩලය ඉක්මවා එම තනතුරු සඳහා බඳවා ගෙන තිබුණි.

## 4. ගිණුම් කටයුතුභාවය සහ යහ පාලනය

### 4.1 අයවැය ලේඛනමය පාලනය

අයවැයගත හා තථ්‍ය වියදම් අතර සැළකිය යුතු විචලනයක් නිරීක්ෂණය වූයෙන් අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් වශයෙන් යොදාගෙන නොතිබුණ.

## 5. පද්ධති හා පාලනයන්

විගණනයේදී නිරීක්ෂණයවූ අඩුපාඩු පිළිබඳව සංවිධානයේ අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත වරින් වර වාර්තා කරන ලදි. පහත සඳහන් ක්ෂේත්‍ර කෙරෙහි කළමනාකරණයේ විශේෂ අවධානය යොමු කළ යුතුය.

(අ) ණයගැති පාලනය

(ආ) ගිණුම්කරණය

(ඇ) කාර්ය මණ්ඩල පරිපාලනය

(ඈ) ව්‍යාපෘති කළමනාකරණය

(ඉ) අයවැය පාලනය